# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1986/1 - 2016 සැප්තැම්බර් මස 26 වැනි සඳුදා - 2016.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 වන වගන්තියේ 2(ඇ) වන උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කාමර 250කින් යුත් හෝටල් ව්‍යාපෘතිය - වැල්ලේ දේවාල පාර, යද්දෙහිමුල්ල, උණවටුන

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව වැල්ලේ දේවාල පාර, යද්දෙහිමුල්ල, උණවටුන දරන ලිපිනයේ අරලිය උණවටුන බීච් හොටෙල් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද වැල්ලේ දේවාල පාර, යද්දෙහිමුල්ල, උණවටුන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත කාමර 250කින් යුත් හෝටල් ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා 2016.09.26 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර).

1. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - අංක 500, ටී. බී. ජායා මාවත, කොළඹ 10
2. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - අංක 811/A, ජයන්තිපුර පාර, බත්තරමුල්ල
4. මධ්‍යම පරිසර අධිකාරිය - අංක 104, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
5. නාගරික සංවර්ධන අධිකාරිය - 6 හා 7 වන මහල, ''සෙත්සිරිපාය'', බත්තරමුල්ල
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදුව
8. ප්‍රාදේශීය සභාව - හබරාදුව
9. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල
10. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ගාල්ල
11. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - ප්‍රාදේශීය කාර්යාලය, අංක 274, පීල්ලගොඩ, උණවටුන


1A - G 24247— 27 (2016/09)

සැ. යු. - අති විශෙෂ ගැසට් අංක 1985/1 කාණ්ඩය අංක 1985/38 න් අවසන් වේ.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මෙම යෝජිත හෝටල් ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2016.09.26 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

2016 සැප්තැම්බර් මස 26 වැනි දින,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.

10-128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.